**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - 2018**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 වියාචනය කළ මතය

------------------------

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ කරුණු අනුව මණ්ඩලයේ 2018 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

---------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම් කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අයිරා පහසුකම් ලබාගැනීම සඳහා රු.325,100,000 ක ස්ථාවර තැන්පතු, ඇප සුරකුමක් ලෙස ඉදිරිපත් කර තිබුණු අතර, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත 07 හි (SLFRS 7) 14 ඒ හා බී වගන්ති ප්‍රකාරව ඊට අදාල අනාවරණය කිරීම් සිදු කර නොතිබුණි. | මෙය අයිරා පහසුකමක් පමණක් වන අතර SLFRS 7 හි 14 (a) හා (b) වගන්ති 7 අනුව ශේෂ පත්‍ර දිනට වගකීමක් හෝ අසම්භාව්‍ය වගකීමක් බවට පත්ව නැත. | අදාල ප්‍රමිතිය අනුව ගිණුම්කරණ හෙළිදරව් කිරීම් සිදු කල යුතුවේ. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 අනුව 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල වත්කම් යටතේ දැක්වෙන රු. 270,654,512 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගනණය කිරීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රමිතයේ 58 ඡේදය අනුව ඒවා වෙන්ව ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් හඳුනා ගැනීම සහ අගය කිරීම LKAS 16 අනුව ඡේද අංක 07 සිට 39 දක්වා සඳහන් කර ඇත. ඒ අනුව ඉඩම් සහ ගොඩනැගිලි වෙන් වෙන්ව හඳුනා ගත යුතු බව සඳහන් කර නැත. | ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කල යුතු අතර ප්‍රමිත අනුව ප්‍රත්‍යාගණනය කල යුතුවේ. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) උඩහමුල්ල ඩිපෝව විසින් ඉකුත් වර්ෂයන්ට අදාලව ගෙවන ලද රු.49,796,553ක් වන සේවක අර්ථසාධක, සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් හා පාරිතෝෂික අධිභාර මුදල් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ලාභය එම අගයෙන් අඩුවෙන් දැක්වුණි. | අදාල දෝෂය සිදුවී ඇත. | අදාල දෝෂ නිවැරදි කර ගැලපීම් කළ යුතුවේ. |
| (ආ) මණ්ඩලයේ ක්‍රීඩාංගණය බාහිර පුද්ගලයන් හා ආයතන වෙත ක්‍රීඩා කටයුතු සදහා ලබාදීමෙන් ලද රු.4,470,901 ක මුදල් මණ්ඩලයේ ආදායමට බැර නොකර ක්‍රීඩා සමාජ ගිණුමට බැර කිරීම නිසා මණ්ඩලයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් වල දක්වා තිබුණි. | සභාපතිතුමා විසින් ලබාදුන් අනුමැතිය මත මෙම ආදායම ක්‍රීඩා පාලක සභා ගිණුමට බැර කරනු ලැබේ. | මණ්ඩලයේ ආදායම් බාහිර ගිණුම්වලට බැර නොකර ආයතනයේ ආදායමට බැර කළ යුතුවේ. |
| (ඇ) 2016 වර්ෂයේදී රජයට පවරාගෙන තිබුණ ඉඩමක් සදහා වන්දි වශයෙන් ලද රු.30,371,875ක මුදල සංචිත ගිණුමකට බැර නොකර අනෙකුත් ආදායම් ගිණුම බැර කර තිබුණි. තවද මෙම ඉඩමෙහි පිරිවැය ඉඩම් හා ගොඩනැගිලි ගිණුම බැර කිරීමට කටයුතු කර නොතිබුණු අතර, ඉඩම සදහා ලද වන්දි මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | මෙම ඉඩම රජයේ කටයුත්තක් සදහා භාවිතා කිරීම වෙනුවෙන් ලද වන්දි මුදලක් පමණක් වන අතර ඒ සදහා කිසිදු වියදමක් ශ්‍රී ලංගම විසින් දරා නොමැත. එමනිසා මෙම මුදල වෙනත් ආදායමක් ලෙස හදුනාගෙන ඇත. | අදාල මුදල නිවැරදි ගිණුම්වල දැක්විය යුතු අතර, නිවැරදි ලෙස මුදල් ප්‍රවාහයේ ද දැක්විය යුතුවේ. |
| (ඈ)මණ්ඩලයේ කෙටි කාලීන ආයෝජන (REP0) රු.350,000,000 ක් 2018 වර්ෂය අවසානයෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, ඒ සදහා ලැබිය යුතු රු.2,549,442 ක පොලී ආදායමක් සමාලෝචිත වර්ෂය සදහා හදුනාගෙන නොතිබුණු අතර එම නිසා මණ්ඩලයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදාල ගිණුම්කරණ දෝෂය සිදුවී ඇත. | අදාල ගිණුම් දෝෂ නිවැරදි කළ යුතුවේ. |
| (ඉ) 2019 ජනවාරි 01 මිලදී ගත් වටිනාකම රු.666,000 ක් වූ ඉන්ධන ලීටර් 6,600 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන තොග වටිනාකමට ඇතුලත්වීම හේතුවෙන් ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | අදාල ගිණුම්කරණ දෝෂය සිදුවී ඇත. | එම ගිණුම් දෝෂ නිවැරදි කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂයේ ගැණුම්වලට අදාලව වෙළඳ කොමිස් හා වට්ටම් රු.165,655,405 ක් වූ අතර එම වටිනාකම නැවත ආදායම් ප්‍රකාශයේ හා ගැනුම් වටිනාකම් තුලට ඇතුලත් කිරීම නිසා ගැනුම් වටිනාකම සහ කොමිස් හා වට්ටම් ආදායම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඩිපෝවන් විසින් මිලදී ගනු ලබන ඩීසල් සඳහා ලබා දෙනු ලබන වෙළඳ වට්ටම් මෙහි ඇතුලත්ව ඇත. | වෙළඳ වට්ටම් ගිණුමගත නොකල යුතුවේ. |
| (උ) මධ්‍යම බස් රථ කාර්යාලයේ ස්ථාවර තැන්පතු වටිනාකම රු. 22,419,960 ක් ලෙස දැක්වුවද, ස්ථාවර තැන්පතු සහතිකපත්වලට අනුව එම ශේෂය සත්‍ය වශයෙන් රු.22,855,062 ක් විය. වෙනසට හේතුව ස්ථාවර තැන්පතු වලින් ලද පොලී ආදායම වූ රු.435,102 ක් ගිණුම්ගත කර නොතිබීම බව නිරීක්ෂණය විය. එම නිසා එම ප්‍රමාණයෙන් පොළී ආදායම අඩුවෙන් සහ ස්ථාවර තැන්පතු වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර තැන්පතු පොලිය නොසලකා ගිණුම්ගත කිරීම නිසා මෙම වරද සිදුවී ඇත. | ස්ථාවර තැන්පතු පොළිය නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතුවේ. |

**1.5.3 නොසැසඳූ පාලන ගිණුම්**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ ණයහිමි ශේෂ හා ඩිපෝ මගින් ඉදිරිපත් කරන ලද ණයහිමි උපලේඛන පරීක්ෂාවේදී රු.3,434,376ක වෙනස්කම් නිරීක්ෂණය විය. | 232,541,414 | 231,051,668 | 3,434,376 | උප ලේඛන සකස් කිරීමේදී අදාල දෝෂය සිදුවී ඇත. | අදාල සැසඳීම් නිවැරදිව සිදුකර නිවැරදි වටිනාකම ගිණුම්වලට ගත යුතුවේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ)දැරණියගල ඩිපෝවේ 2018 දෙසැම්බර් 31 දිනට බැංකු අයිරාව රු.2,127,679ක් වුවද, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල එම අයිරාව රු.5,778,641ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.3,650,962 ක වෙනසක් නිරීක්ෂණය වුණි. | 5,778,641 | 2,127,679 | 3,650,962 | රු.2,127,670 ලෙස දක්වා ඇත්තේ දැරණියගල ඩිපෝවේ බැංකු ප්‍රකාශනය අනුව ශේෂයයි. රු.5,778,641 වටිනාකම මුදල් පොත අනුව ශේෂය වන අතර එය මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් කර ඇත. මෙම වෙනසට හේතුව බැංකු සැසඳුම් ප්‍රකාශය මගින් පෙන්වාදී ඇත. | අදාල සැසඳීම් නිවැරදිව සිදුකර නිවැරදි වටිනාකම ගිණුම්වලට ගත යුතුවේ. |
| (ඇ)2018 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය ඩිපෝවෙහි බැංකු ශේෂ සනාථන ලිපි අනුව ස්ථාවර තැන්පතු 02 ක් නිරීක්ෂණය වූ අතර, ඒවා පිළිවෙළින් රු.16,563,317 ක් සහ රු.1,581,212 ක් විය. නමුත් ශේෂ පිරික්සුම තුල රු.16,400,000 දැක්වූ අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව රු.1,744,529 ක වෙනසක් නිරීක්ෂණය විය. | 16,400,000 | 18,144,529 | 1,744,529 | ඇඹිලිපිටිය ඩිපෝවේ ස්ථාවර තැන්පතු කල් පිරීමේදී කාල පරිච්ඡේදයට අදාල පොලිය සමග නැවත ආයෝජනය වී ඇත. එය ගිණුම්ගත නොවීම නිසා පොලී අගයද එකතු වී නැවත ස්ථාවර තැන්පතුවට එකතුවී ඇත. එය ගිණුම්ගත නොවීම නිසා මෙම වරද සිදුවී ඇත. | අදාල ආයෝජන හා ඊට අදාල පොලිය නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතුවේ. |

**1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අමතර කොටස් මිලදී ගැනීමට හා සහනදායී ප්‍රවාහන සේවාවන් පවත්වාගෙන යාමට භාණ්ඩාගාරයෙන් ලද මුදලින් රු. 4,892,941,638 ක මුදලක් මණ්ඩලයේ නිලධාරින්ගේ, රියදුරු හා කොන්දොස්තර මහතුන්ගේ වැටුප් සඳහා වැය කර තිබුණු අතර ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | භාණ්ඩාගාරයේ නියමකළ අරමුණු සඳහා පමණක් අදාල මුදල් වියදම් කල යුතුවේ. |

**1.5.5 අක්‍රිය ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ හා ජංගම නොවන වගකීම් යටතේ ක්‍රියාත්මක නොවන ගිණුම් ලෙස පිළිවෙළින් රු.1,290,582,782 ක් හා රු.18,526,264,583 ක් නිරවුල් නොවී ඉදිරියට පැවත එමින් තිබුණු අතර මේවායේ නිවැරදිතාවය හෝ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය . | 2017 වර්ෂයේ අක්‍රිය ගිණුමෙහි රු.9,935,459,128ක හර ශේෂයක්ද, රු.26,054,954,882.06 ක බැර ශේෂයක්ද පැවතිනි. එම ශේෂයන් නිරවුල් කිරීම සඳහා 03 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදි. එම කමිටුව මගින් රු. 8,644,676,346.73ක හර ශේෂයක්ද, රු.7,528,690,099ක බැර ශේෂයක්ද නිරවුල් කරන ලදි. ඉන්පසු එම කමිටුවෙහි සාමාජිකත්වය දරණ ලද මහා භාණ්ඩාගාර නියෝජිත මහතා මෙම කමිටුවෙන් ඉවත් වූ අතර, ඒ සඳහා වෙනත් සාමාජිකයෙකු පත්කල මුත් මේ වන විට රටේ පවත්නා වසංගත තත්ත්වය හේතුවෙන් නව කමිටුවට මේ වන තෙක් රුස්වීමට නොහැකි විය. | මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |

| | | | | |
|---|---|---|---|---|
| විවිධ ණයගැති ශේෂය | 108,227,804 | උපලේඛන හා වයස් විශ්ලේෂණ | මේ සම්බන්ධව විස්තර හා උප ලේඛන ප්‍රාදේශිකයන්, ඩිපෝවන් හා ප්‍රධාන කාර්යාලයන් ලෙස වෙන් වෙන් වශයෙන් ඔබ කාර්යාලයට ලබාදී ඇත. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සඳහා විස්තර හා උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. |
| කොන්දොස්තර හිග ශේෂය | 5,784,775 | | | |
| මුදල් අයකැමි හිඟ ශේෂය | 34,391,996 | | | |
| වෙළඳ ණයහිමි | 3,444,436,890 | | | |
| ප්‍රාග්ධන සංචිත හා වෙනත් සංචිත | 5,301,844,512 | | | |
| හිමිකම් ප්‍රාග්ධනය | 350,000,000 | | | |
| භාණ්ඩාගාර කොටස් ප්‍රාග්ධනය | 3,944,890,550 | | | |
| ස්ථාවර තැන්පතු | | | | |
| රජයේ ප්‍රදාන | 700,920,663 | | | |
| අක්‍රීය ගිණුම්(හර ශේෂය) | 2,981,392,313 | | | |
| ස්ථාවර වත්කම් | 1,290,782,782 | | | |
| අක්‍රීය ගිණුම්(බැර ශේෂය) | 29,391,137,146 | | | |
| දේශීය මිලදී ගැනුම් | 18,526,264,783 | | | |
| අත්තිකාරම් | 203,913,674 | | | |
| ආපසු ගෙවිය යුතු සේවක තැන්පතු | 156,966,291 | | | |
| ලැබිය යුතු උසාවි තැන්පතු | 7,994,271 | | | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට නොපියවූ දේශීය මිලදී ගැනුම් අත්තිකාරම් ශේෂය රු.1,511,690,256 ක් වී තිබුණි. මෙම මිලදී ගැනුම් අත්තිකාරම් තුල 2011 වර්ෂයේ සිට නොපියවූ අත්තිකාරම් ශේෂ පවතින අතර, ඉන් රු.1,135,202,561 ක මුදලක් 2013 හා 2014 වර්ෂ වලදී ලබාදුන් අත්තිකාරම් බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් වියදම් හා වත්කම් ශේෂ අඩුවෙන් පෙන්වා තිබුණි. | මෙතෙක් නොපියවූ අත්තිකාරම් සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඇති අතර, මෙම අත්තිකාරම් 2013, 2014 හා 2015 වර්ෂවලට අදාල වේ. | අදාල අත්තිකාරම් ලබාදීම හා අත්තිකාරම් පියවීම පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය -9.2 වගන්තිය | මණ්ඩලය කාර්ය මණ්ඩලය සඳහා සංවිධාන සටහනක්, බඳවා ගැනීමේ පරිපාටියක් හා උසස්වීම් පරිපාටියක් පිළියෙළ කර කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛය අනුව අදාල බඳවා ගැනීම් පරිපාටිය හා උසස්වීම් පරිපාටිය අනුමත කර ක්‍රියාත්මක |

| | | | |
|---|---|---|---|
| | අනුමත කරවාගෙන නොතිබුණි. | | කල යුතුවේ. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 110 | මණ්ඩලය විසින් හානි පිළිබඳ වාර්තා කිරීමට ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මණ්ඩලීය පිළිවෙත් ප්‍රකාරව අනතුරු අලාභ වෙනත් වත්කම් අලාභ සඳහා අදාල පොත්පත් හා වාර්තා නඩත්තු කරනු ලබයි. අදාල අලාභයක් තිබුණහොත් අය කිරීමට කටයුතු කරනු ලබයි. | මුදල් රෙගුලාසි අනුව හානි ලේඛනයක් පවත්වාගෙන යායුතු වේ. |
| (ii) මුදල් රෙගුලාසි 381 | රාජකාරි බැංකු ගිණුම් ආරම්භ කිරීමේදී භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කල යුතු වුවත් එසේ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය විසින් බැංකු ජංගම ගිණුම් 18 ක් ක්‍රියාත්මකව තිබුණි. | මෙම බැංකු ගිණුම් පෙර සිට පැවත එන ඒවා වන අතර මේ වන විට අනවශ්‍ය සියළුම බැංකු ගිණුම් අක්‍රිය කිරීමට කටයුතු කර ඇත. | බැංකු ගිණුම් ආරම්භ කිරීමේ හා පවත්වාගෙන යාමේ නිසි ක්‍රමවේදය අනුගමනය කල යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,285,969,924 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 1,618,237,714 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.332,267,790 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් මෙහෙයුම් වියදම රු.171,491,777 වැඩිවීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

- සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ ප්‍රධාන ආදායම් තුල ඇතුලත් ගැමි සැරිය සහ පුවත්පත් ප්‍රවාහන ආදායම පිළිවෙළින් සියයට 100 කින් හා සියයට 76 කින් අඩු වී ඇත. තවද ඉන්ධන හලේ ආදායම සියයට 93 කින් හා සංචාරක බංගලා ආදායම සියයට 48 කින් පමණ අඩුවී තිබුණි.

- මණ්ඩලයේ රියදුරු හා කොන්දොස්තර සඳහා වන අතිකාල දීමනා වියදම් 2017 වර්ෂයට සාපේක්ෂව 2018 දී සියයට 18 කින් වැඩිවී තිබූ අතර බස්රථ සඳහා වන ඉන්ධන වියදම් සියයට 12 කින් ද වෙනත් විශේෂ දීමනා සියයට 31 කින් සහ අළුත්වැඩියා හා නඩත්තු වියදම් සියයට 57 කින් ද වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

-----------------------------

- සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 1.66 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ අනුපාතය වන 1.76 ට සාපේක්ෂව අඩු අගයක්ව පැවතීම යහපත් තත්වයක් ලෙස නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂයේ ලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 1.25 කින් අඩු වී තිබුණි. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් මෙහෙයුම් වියදම රු. 2,001,516,678 වැඩිවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් හා පාරිතෝෂික මුදල් නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.183,725,038 ක මුදලක් අධිභාර වශයෙන් වියදම් දැරීමට සිදුවී තිබුණි. | ශ්‍රී ලංගම තුල පැවති ආයහපත් මූල්‍ය තත්ත්වය නිසා 2018 වර්ෂයට පෙර විශ්‍රාම ගිය සේවකයන් සඳහා නියමිත දිනට පෙර පාරිතෝෂික ගෙවීමට නොහැකි වී ඇති අතර ඒ මත ගෙවීමට සිදු වූ අධිභාර මුදල් මෙහි දක්වා ඇත. | අදාල අර්ථසාධක හා අනෙකුත් මුදල් නිසි වේලාවට ගෙවා අධිභාර ඇතිවීම වලක්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) මණ්ඩලයේ සමාලෝචිත වර්ෂය අවසන් දිනට මුදල් හා මුදල් වලට සමාන දෑ හි එකතුව රු.3,968,913,250 ක්ව තිබියදී, විවිධ අවස්ථාවන්හිදි බැංකු අයිරා ලබාගෙන තිබුණු අතර වර්ෂය අවසන් වන විට රු.131,747,317ක අයිරාවන් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම අයිරා පහසුකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.9,115,565 ක් අයිරා පොළී ලෙස ගෙවා තිබුණි. | 2018 වර්ෂය වන තෙක්ම ශ්‍රී ලංගම දැඩි මූල්‍ය අර්බුදකාරී තත්වයක් තිබු අතර එවකට ඩිපෝවන් විසින් බැකු අයිරාවන් ලබා ගෙන තිබුණි. | මණ්ඩලයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය නිසි පරිදි සිදු කිරීම මගින් අයිරා සඳහා පොළී ගෙවීම අවම කරගත යුතුවේ. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය ප්‍රාදේශීය කාර්යාල, ඩිපෝ, රියදුරු පුහුණු පාසල් හා ප්‍රාදේශීය වැඩපළ ආදි විවිධ ප්‍රදේශ වල පවත්වාගෙන යන ආයතන වලට අදාල ඉඩම් පිළිබඳ ලේඛනයක් හා ඊට අදාල ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි. තවද මණ්ඩලයේ ඩිපෝ හා ප්‍රාදේශිය වැඩපොලවල් පිහිටා ඇති අක්කර 160 ක් වූ ඉඩම් වල අයිතිය නිරවුල් කරගෙන නොතිබීම හා භාවිත කරන හා භාවිත නොකරන ඉඩම් මායිම් නිර්ණය කොට ආරක්ෂිත වැටවල් යොදා නොතිබුණි. | ශ්‍රී ලංගම විසින් භුක්ති විදින ඉඩම්වල මායිම් වැටවල් සකස් කිරීම සඳහා එම ඉඩම්වල ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇති අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබාදී ඇත. එලෙස ආරක්ෂක වැටවල් ඉදිරිකිරීම සඳහා මෙම ඉඩම් මැනීමේ කටයුතු සිදු කල යුතු අතර, ඒ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් ප්‍රවාහන කළමනාකාරණ අමාත්‍යාංශයේ ජ්‍යෂ්ඨ සහකාර ලේකම් (ඉඩම්) තැනගේ උපදෙස් පරිදි අවශ්‍ය ලේඛන සකස් කොට එම ලේඛන අමාත්‍යංශය ලේකම් තැන වෙත යොමු කිරීමෙන් පසුව එතුමාගේ ප්‍රධානත්වයෙන් අදාල ප්‍රාදේශිය ලේකම්වරු කැඳවා එකවර මෙම ඉඩම් මැනුම් කර අයිතිය ශ්‍රී ලංගම වෙත පවරා ගැනීමෙන් අනතුරුව ආරක්ෂක වැටවල් යෙදීමට කටයුතු කරනු ඇත. | ඉඩම් වල අයිතිය, පිළිබඳ ලේඛන ඔප්පු මෙන්ම ඒවා සඳහා ආරක්ෂිත වැටවල් ආදිය නිවැරදි ලෙස සකස් කර ගැනීම කළ යුතුවේ. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් පළාත් 9 තුල වාහන වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදිකිරීම සඳහා අදාල උපකරණ කට්ටල 2018 අප්‍රේල් 26 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වාහන වායු විමෝචන භාරකාර අරමුදල වෙතින් භාරගෙන තිබූ අතර මෙම මධ්‍යස්ථාන ඉදිකිරීම ශක්‍යතා අධ්‍යනයකින් සිදු කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථාන අතරින් කුරුණෑගල හා මැදවච්චිය යන මධ්‍යස්ථාන ඉදිකිරීම් නිමකර විවෘත කර තිබුණද නීතිමය ගැටලුවක් නිසා වසා පැවතුනි. එම මධ්‍යස්ථාන වල වටිනාකම රු.මි. 18.75 ක් වන මෙම යන්ත්‍ර සූත්‍ර නිෂ්කාර්යව පවතින බවත්, මෙම වත්කම් භාවිතා කිරීමට සුදුසු පරිදි අදාළ සිවිල් වැඩ ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල වන රු. මිලියන 89.84 කින් රු.මිලියන 22.48 ක මුදලක් පමණක් විගණිත දිනය වූ 2019 සැප්තැම්බර් 30 වන විට වැයකර තිබුණි. තවද, වාහන වායු විමෝචන යන්ත්‍ර සවිකර සහතික නිකුත් කිරීම හා නිකුත් කල සහතික පිළිබඳ දත්ත වාහන විමෝචන භාරකාර අරමුදලට ගෙවිය යුතු වන අතර, ඒ සඳහා අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙතින් අන්තර්ජාල පහසුකම් ලබා ගෙන රු.164,280 ක් ගෙවා ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතියෙහි කටයුතු අවසන් කර නොතිබුණි. | 2018 වර්ෂයේ මුදල් කාර්තුව තුල පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ලබාදුන් තීරණයක් මත මෙම උපකරණ කට්ටල ශ්‍රී ලංගමට භාර ගැනීමට සිදුවිය. මෙම ව්‍යාපෘති යෝජනාව ශ්‍රී ලංගම මගින් ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘතියක් ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ බැවින් අවශ්‍ය ඉදිකිරීම් සිදු කරන ලදි. | ප්‍රාග්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේදී ශක්‍යතා අධ්‍යයන වාර්තා, පිරිවැය ප්‍රතිලාභ වාර්තා, පරිසර ආරක්ෂණ වාර්තා සලකා බලා ඒ අනුව ව්‍යාපෘති ඇරඹීමට ක්‍රියා කල යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති PED/12 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ | පිළිතුරු සපයා නොමැත. | ගිණුම් ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. |

වසර 02 මාස 03 ක් දින 19 ප්‍රමාද වී 2020 ජූනි 19 දිනදීය.

**4.2 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික වාර්තා අවසන් වරට පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2017 වර්ෂය සඳහා වේ. | පිළිතුරු සපයා නොමැත. | වාර්ෂික වාර්තා නිසි පරිදි ගිණුම් ප්‍රකාශන විගණන කළ පසු පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුවේ. |

**4.3 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම සකස්කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | සංයුක්ත සැලැස්ම චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කළ යුතුවේ. |

**4.4 ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2. ඡේදය ප්‍රකාරව සැලසුම් කරන ලද කාලය තුල අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීමට හැකිවන පරිදි කළමනාකරණයේ වගකීම පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට නොගෙන ලඟාකරගත නොහැකි අරමුණු හා ඉලක්ක ඇතුලත් කර පිළියෙල කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අදාළ චක්‍රලේඛය ප්‍රකාර ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුවේ. |

**4.5 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/5P/5dg/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව | පිළිතුරු සපයා නොමැත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන සැලසුම් සකස් කළ යුතුවේ. |

තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.6 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබූ අතර, එහි කාර්ය මණ්ඩලයට අයත් ප්‍රධාන අභ්‍යන්තර විගණක I ශ්‍රේණියේ නිලධාරියකු විය යුතු වුවත් III ශ්‍රේණියේ නිලධාරියකු වූ අතර, සමස්ත කාර්ය මණ්ඩලය 90 ක් විය. අභ්‍යන්තර විගණන වැඩසටහන විගණකාධිපතිට ඉදිරිපත් කළද, එම වැඩසටහන මගින් ශ්‍රී ලංගමය සම්බන්ධයෙන් අවධානය යොමු විය යුතු මෙහෙයුම් අකාර්යක්ෂමතා, ඉන්ධන පරිභෝජනය, නඩත්තු සේවා, නිෂ්ක්‍රීය තොග, බස් රථ සේවාවේ කාර්යක්ෂමතාවය හා ගුණාත්මක බව, ස්ථාවර වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව ආදී ක්ෂේත්‍ර ආවරණය වී නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව අභ්‍යන්තර විගණන සැලැස්ම මණ්ඩලයේ ප්‍රධාන අංශ ආවරණය වන පරිදි සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. |

### 4.7 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය පරිදි අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, අයවැයගත ශේෂ පත්‍රය, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අයවැයගත ප්‍රාග්ධන වියදම් වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛය පරිදි අයවැය වාර්තා පිළියෙල කළ යුතුවේ. |

**4.8** පාරිසරික ගැටලු

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඩිපෝ පරිශ්‍රයන්හි ඇති අංගනවල තෙල් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිළිගත් අනුමත ක්‍රමවේදයක් භාවිතා කළ යුතු අතර, 2008 ජනවාරි 25 දිනැති හා අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, මණ්ඩලයේ ඩිපෝ 107 න් ඩිපෝ 09 ක් හැර අනෙකුත් ඩිපෝ එම පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | සියලුම ඩිපෝවල පරිසර ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීම සඳහා උපදෙස් ලබාදී ඇත. | අදාල පාරිසරික බලපත්‍ර ලබාගෙන නොමැති අනෙකුත් ඩිපෝ 84 ද අදාල බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |